විස්තර සටහන - 2019 අංක 01

බැංකු අධීක්ෂණ අංශය

2019-05-16 දින

## <u>සංචාරක කර්මාන්තය සඳහා අනුමත කළ සහන දැක්වෙන 2019 අංක 07 දරණ චක්‍ර ලේඛනයේ අර්ථ දැක්වීම.</u>

2019-05-08 වන දිනැති යොමු කරන ලද 2019 අංක 07 දරණ චක්‍ර ලේඛයට අදාළ සංචාරක කර්මාන්තය සඳහා අනුමත කළ සහන පිළිබඳ අර්ථ දැක්වීම් පහත පරිදි වේ.

**1. තනිපුද්ගල යනු**

සංචාරක ක්ෂේත්‍රය තුළ සංචාරක සේවා සපයන ආයතන වල ස්ථිර සේවකයන් හා සංචාරක සේවා සපයන පුද්ගලයන් මෙම ගණයට ඇතුළත් වේ.

**2. ලියාපදිංචිය**

i). සංචාරක සේවා සපයන ව්‍යාපාරික සහ පුද්ගලික ආයතන 2019-04-18 දින වන විට පහත දැක්වෙන කුමන හෝ ආයතනයන් සමඟ ලියාපදිංචි වී තිබිය යුතුය.

a) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
b) i) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
   ii) ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය
   iii) ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය
c) ශ්‍රී ලංකා හෝටල් සංගමය

ii). 2019-04-18 දින වන විට ඉහත දැක්වූ 2 (i) යටතේ ලියාපදිංචි වී නොමැති ආයතන, මෙම ණය සහන ලබා ගැනීමට ඔවුන්ගේ ව්‍යාපාර සහ සේවාවන් අවම වශයෙන් පළාත් පාලන ආයතන සමඟ (ප්‍රාදේශීය සභා, නගර සභා හෝ මහ නගර සභා) 2019-04-18 දින වන විට ලියාපදිංචි වී තිබිය යුතු අතර එම ආයතන සහ පුද්ගල පුදගලයන් 2 (i) හි ඉහත දැක්වූ ආයතනයක නව ලියාපදිංචියද ලබා ගත යුතු වේ.

**3. ණය පියවීමට සහන කාලය අනුමත කිරීම.**

i). ණය සහනය ලබා ගැනීමට බලාපොරොත්තුවන ආයතන සහ පුද්ගලයන් බලපත්‍රලාභී බැංකුවක් වෙත එම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු වේ.

ii). බලපත්‍රලාභී බැංකුව 2 වන ඡේදයෙහි දක්වා ඇති අවශ්‍යතාවයද සමඟ එම ඉල්ලීමට වෙන් වෙන් වශයෙන් සලකා බලා අදාළ මූල්‍ය සහය පිරිනැමීම සඳහා සුදුසු බව නිගමනය කළ යුතුය.

iii). මෙම ණය ගෙවීමේ සහන කාලය ( ප්‍රාග්ධන අරමුදල් සහ පොලිය පියවීම ) 2019-04-18 වන දින වන විට විධිමත් ලෙස පියවමින් පැවති ණය ලබා ගෙන ඇති ආයතන සහ පුද්ගලයන් සඳහා වලංගු වේ.

iv). බලපත්‍රලාභී බැංකු සංචාරක කර්මාන්තය සඳහා සහන ලබා දෙන ලද 2019 අංක 07 දරණ මහ බැංකු චක්‍ර ලේඛයට අනුව අදාළ ණය ගෙවීමේ සහනය ඉල්ලා සිටින පුද්ගලයන් හා ආයතන වෙත එය පිරිනැමිය යුතුය.

**4. SLFRS 9 අනුව ගිණුම් වාර්තා සැලකිල්ලට ගැනේ.**

i). බලපත්‍රලාභී බැංකු ශ්‍රී ලංකා ගනකාධිකාරීවරුන් ලබා දී ඇති උපදෙස් අනුව පිළියෙල කරන ලද අදායම්, මූල්‍යමය වත්කම්, පොලී අදායම් මේ සඳහා සැලකිල්ලට ගත යුතු වේ.